**(හැඳින්වීම)**

අද ආගමන සමයේ පළමුවන ඉරු දින වන අතර බලාපොරොත්තුවේ ඉරුදින යි.

අදින් නව ජනවන්දනා වර්ෂයකට ඇතුළු වන ශුද්ධ වූ සභා මාතාව, මෙම විශේෂිත කාලය තුළ ගැළවුම්කරුවාණන්ගේ පළමු පැමිණීම සැමරීම සඳහා අප හදවත් සූදානම් කරන අතරම, දෙවන පැමිණීම සඳහා අවදිව සිටීමට අපට මග පෙන්වනු ලබයි.

අද පළමු දේව ප්‍රකාශනයෙන් දාවිත් රජ පරපුරෙන් පැවතෙන දැහැමි උතුමෙකු පිළිබඳව සමිඳාණන් වහන්සේ ඊශ්‍රායෙල්වරුන්ට ලබා දුන් පොරොන්දුව ඉදිරිපත් කරයි. ක්‍රිස්තු පුනරාගමනයේ දී අප සිත් ශුද්ධව සහ නිදොස්ව පවතින ලෙස ප්‍රේමයෙහි පවතින්නට දෙවන දේව ප්‍රකාශනයෙන් අපට ආරාධනා කරයි. මනුෂ්‍ය පුත්‍රයාණන් බල පරාක්‍රමයෙන් වඩින කළ සිදු වන්නට නියමිත දේ පිළිබඳව ද, ජයාන්විතව ගැළවෙනු ලබන්නේ අවදිව සිටින්නන් බව ද සුපුවත තුළින් ප්‍රකාශ කරයි.

ක්‍රිස්තු ආගමනයේ බලාපොරොත්තුව වඩාත් තීව්‍ර කරවන මෙම කාලයේ දී, සැබෑ ජීවිත පරිවර්තනයක් ඇති කර ගනිමින්, සාම කුමරුවාණන් අප ජීවිතවලට පිළිගන්නට අවැසි දෙව් වරම් ඉල්ලා, අප සැම මෙම උතුම් වූ දිව්‍ය යාගයට භක්තියෙන් සහභාගී වෙමු.

**(විශ්වාසිකයන්ගේ යැදුම්)**

පිළිතුර - ස්වාමිනී, අප කරන යාච්ඤා අසා වදාළ මැනව.

1) ආදර දෙවි පියාණනී, මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ දෙවන ආගමනය පිළිබඳ බලාපොරොත්තුව සිත් තුළ වර්ධනය කර ගනිමින්, නිදොස් හා පවිත්‍ර සිතින් මෙලොව දිවි ගෙවන්නට ශුද්ධ වූ සභාවේ පූජක, පැවිදි සහ ගිහි සාමාජික සාමාජිකාවන් සැමට අවැසි ශුද්ධාත්ම වරම් බහුලව දානය කරන පිණිස,

2) ආදර දෙවි පියාණනී, අදින් ඇරඹුනු මෙම ආගමන සමය තුළ, නිසි සූදානමකින් සාමයේ කුමාරයාණන්ව පිළිගන්නටත්, සැබෑ සාමය හා සංහිඳියාව අත්දකින්නටත් අප මීසම් පවුලේ සැමට අවැසි නිසි මග පෙන්වීම දානය කරන පිණිස,

3) ආදර දෙවි පියාණනී, සියලු ආකාර ස්වභාවික විපත් සහ ආපදා තත්ත්වයන්ගෙන් අප මව්බිම ආරක්ෂා කර, අනේක වූ අසරණකම් හා කලකිරීම්වලින් මිදුණු යහපත් ජන ජීවිතයක් ද, යුක්තිසහගත පාලන තන්ත්‍රයක් ද දේශය තුළ යළි ගොඩනගන පිණිස,

4) ආදර දෙවි පියාණනි, මෙම නව ජන වන්දනා වසර පුරා ශුද්ධ වූ සභා මාතාව නිරන්තරයෙන් ආසිරි ගන්වමින්, ගැඹුරු යාච්ඤාව සහ දේව වචනය තුළින් සමිඳුන්ට ප්‍රසන්න වූ ආලෝකයේ ක්‍රියාවන් වෙත යොමුවන්නට ද, සැබෑ කිතුනු සහෝදරත්වයෙන් බැඳී ප්‍රේමයෙහි පවතින්නට ද අප සැමට අවැසි වරම් දානය කරන පිණිස,